**චක්‍ර ලේඛ අංක: 07/99(1)**

මගේ අංකය: බප/සසේකො/ලේ.නිර්/2007
සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.)
අංක 50, කිතුල්වත්ත පාර,
කොළඹ 08.
2007.01.16

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමූපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම් හා ස.ණ.ස. සමිති වල
සභාපතිවරුන් වෙත.

<u>සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින් සඳහා දීමනා ගෙවීම.</u>

මෙම කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති 7/99 චක්‍රලේඛයේ <u>එ. තේරීම් මණ්ඩලයට ගෙවීම් කිරීම</u> හා සම්බන්ධ ඡේදය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන අතර, දැනට පවත්නා මූලයමය අගය සහ සම්මුඛ පරීක්ෂණ වලදී ඉදිරිපත් කරන අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව සලකා බැලීමෙන් අනතුරුව එකී ඡේදයේ සඳහන් දීමනාවන් අවලංගු කර ඒ වෙනුවට පහත සඳහන් පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සඳහා ගෙවීම් කිරීමට කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇති බව කොමිෂන් සභාවේ නියමය පරිදි මෙයින් දන්වමි.

අ. විධායක ශ්‍රේණියේ තනතුරු වලට අපේක්ෂකයින් තෝරා ගැනීමේදී සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වන එක් අපේක්ෂකයකු වෙනුවෙන් රු. 40/- බැගින් ගෙවීමත් ලබා ගැනීමට සෑම තේරීම් මණ්ඩල සාමාජිකයකුටම හිමිකම තිබේ.

ආ. සෙසු තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වන එක් අපේක්ෂකයකුට රු. 25/- බැගින් මුදලක් සෑම තේරීම් මණ්ඩල සාමාජිකයකුටම ලබා ගැනීමට හිමිකම් තිබේ.

ජේ.ජේ. සිරිසේන,
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:-
1. බස්නාහිර පළාතේ සමූපකාර හා පළාත්මාර්ග අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්
2. ප්‍රධාන ලේකම් (බ.ප.)
3. ලේකම්, සමූපකාර හා පළාත්මාර්ග අමාත්‍යාංශය (බ.ප.)
4. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)
5. සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ, කළුතර, ගම්පහ)
6. ලේකම්, සමූපකාර සේවක කොමිෂන් සභාව
7. සියළුම පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
8. සියළුම වෘත්තීය සමිති සංගම්